# සපතේරු මාමායි හිත හොඳ සුරංගනාවියයි



උමානි උත්කර්ෂා ගුණවර්ධන

# සපතේරු මාමායි
# හිත හොඳ සුරංගනාවියයි

© උමානි උත්කර්ෂා ගුණවර්ධන
කර්තෘ ප්‍රකාශයකි.


| | |
|---|---|
| ප්‍රථම මුද්‍රණය | : 2025 පෙබරවාරි 08 |
| කර්තෘ | : උමානි උත්කර්ෂා ගුණවර්ධන |
| කතෘගේ ලිපිනය | : 95/2, උඩුවෙල පාර, අම්පිටිය. |
| පාසල | : මහමායා බාලිකා විදුහල |
| ශ්‍රේණිය | : 2 ශ්‍රේණිය A |

# පිදුම

මාගේ ආදරණීය අම්මාට හා තාත්තාටත්

මාගේ ආදරණීය

මහමායා අම්මාටත් දැයේ සියළුම යහළු

යෙහෙළියන්ටත් ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එක ගමක සපත්තු මහලා ජීවත්වෙන මාමා කෙනෙක් හිටියා. තනිවම තමයි එයා ජීවත් වුණේ. සපත්තු මහන නිසා හැමෝම එයාට කිවුවේ සපතේරු මාමා කියලා.





මේ මාමා හරිම ගුණයහපත් කෙනෙක්. ගොඩාක් අය ආවා මේ මාමාගෙන් සපත්තු ගන්න. මාමාත් හැමෝටම ලස්සන සපත්තු මහලා දුන්නා.

ටික කාලයක් ගෙවුනා. මාමා අසනීප වුණා. ඉස්සර වගේ දැන් වැඩකරන්නත් බෑ. "දැන් මට සපත්තු මහන්නත් අමාරුයි. සලකන්න කෙනෙකුත් නෑ." මාමා කල්පනා කළා.



මාමා ගොඩාක් දුකින් හිටියේ. දවසක් මාමා උදෙන්ම අමාරුවෙන් සපත්තු මහන තැනට ආවා. ලස්සන සපත්තු දෙකක් මේසය උඩ තිබුණා.



"කව්ද? මෙහෙම සපත්තු මහලා තියෙන්නේ" මාමා කල්පනා කළා. එදා රෑ මාමා නිදාගන්නේ නැතුව හොරෙන්ම සපත්තු මහන තැනට ආවා.



ලස්සන ගෑණු ළමයෙක් සපත්තු මහනවා. "ඔයා කව්ද?" මාමා ඇහුවා. සපත්තු මහමින් සිටි ගෑණු ළමයා එකපාරටම බය වුණා. එයා ලස්සන සුරංගනාවියක්.




මාමා පුදුම වුණා. "ඔයා හරිම හොඳ කෙනෙක්, ඔයා දුකින් හිටපු නිසා මට උදවු කරන්න හිතුනා" සුරංගනාවි කිවුවා.



මේ සපත්තු විකුණලා මුදල් හොයාගන්න. සුරංගනාවී මාමාට කිවුවා. මාමා සපත්තු විකුණලා මුදල් හොයාගත්තා. මාමාට ගොඩාක් සතුටුයි.



ගමේ අය වගේම පිටගම්වල අයත් ආවා මාමාගෙන් සපත්තු ගන්න. ලස්සන සපත්තු ගොඩාක් මාමා ළඟ තිබුණා.



දැන් සුරංගනාවියත් හැමදාම සපතේරු මාමාත් එක්ක සපත්තු මහනවා. නැති බැරි අයටද උදවු කරමින් මාමා සතුටින් ජීවත් වුණා.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

**ISBN 978-624-208-344-5**